# සංස්කාරකගෙන්



ශ්‍රී ලංකාව තුල සිටින අසූ දහසකට නොඅඩු තරුණ ගොවි සමාජ සාමාජිකයින්ට මෙම වර්ෂය විසිපස් වසරක තරුණ ගොවි සමාජ ව්‍යාපාරය, සිහිපත් කරවන උත්සවාකර්ශවත් වසරකි.

මුලින්ම පාසැල් වලට පමණක් සීමාවූ තරුණ ගොවි සමාජ ව්‍යාපාරය හාභාපුරා කියා ඇරඹී ඇත්තේ 1950 දී අඟේදුස්සේ කිතදෙනිය නම් පාසලේදීය. පාසලින් ගම දක්වා පුළුල්ව ගිය මෙම ව්‍යාපාරය දැනට දිවයිනේ ගම් රාශියක තරුණ තරුණියන් පිරිවරා ගත් බලවත් තරුණ ගොවි ව්‍යාපාරයක් බවට පත්වී ඇත.

තරුණයින් අප සමාජයේ සංස්කෘතියේ වැදගත් කොටසක් වේ. ඔවුන් සමාජය, සංවර්ධනය කරා යොමුකරවන අනාගත නායකයන් වනු ඇත. ශ්‍රී ලංකාව වැනි බහුතර ජනතාව ගොවිතැනේ යෙදී සිටින එමෙන්ම ජනතාවගෙන් වැඩි දෙනෙක් ග්‍රාමීය වෙසෙන රටක, තරුණ ගොවි සමාජ ව්‍යාපාරය, රටේ යෞවනයින්, විශේෂයෙන් ග්‍රාමීය තරුණ තරුණියන් සහ පාසැල් වලින් ඉවත්ව යන තරුණ තරුණියන්ට විද්‍යාත්මක ගොවිතැන හා ක්‍රමවත් පශු පාලනය පිළිබඳ අධ්‍යාපනයක් හා පුහුණුවක් ලබාදීම යටබත්ධ වටිනා වගකීමක් සතු ව්‍යාපාරයක් ලෙස හැඳින්විය හැක.

කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය ගැන සඳහා බලන විට පමා, තරුණයින්ගේ සහභාගීත්වයෙන් තොර ව්‍යාප්ති සැලැස්මක් පරිපූර්ණ එකක් නොවන බව පැහැදිලි වී ඇත. දූ පුතුන් මගින් නව අදහස් දෙමව්පියන්ට සංක්‍රමණය කිරීම වඩා කාර්යක්ෂම බැවින් තරුණ ගොවි සමාජ, ග්‍රාමීය කෘෂිකාර්මික ව්‍යාප්තියේ, නියෝජිත ආයතන වශයෙන් දක්වා ලිය හැක.

තරුණ ගොවි සමාජ කටයුතු මගින්, තරුණ තරුණියන්ට ඔවුන්ගේ අභිමානය හා හැකියාවන් විදහා දක්වීමට අවකාශ ලැබී ඇත. පාසලින් ඉවත්ව යන තරුණ තරුණියන් බොහොමයක් ත. ගො. ස. උපයෝගී කරගනිමින් තමන්ගේ හා පවුලේ ආදායම් තත්ත්වය වැඩිදියුණු කරගෙන තමන් වාසය කරන ප්‍රදේශයේ පිළිගත් පුද්ගලයින් බවට පත්වී ඇත.

තරුණ ගොවි සමාජ ව්‍යාපාරය සංවිධානය කිරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු වගකීමක් වුවද, වැඩ සැලැස්මවන් තෝරා ගැනීම, ක්‍රියාත්මක කිරීම සමාජයේ සාමාජිකයින් සතු කාර්යයක් වනු ඇත. මෙවන් කටයුත්තකදී ස්වෝත්සාහය හා ස්වාධීන බව සංවර්ධනය කර ගැනීමටත්, සමාජයක් වෙනුවෙන් සාමූහිකව කටයුතු කිරීමෙන් නායකත්වය වැනි ගුණාංග පුහුණු කර ගැනීමටත් ඔවුන්ට අවස්ථාවක් ලැබෙනු ඇත.

යෞවන වයසේදී ඇතිවන කලබලකාරී සිතුම් පැතුම් හා චංචල ගතිගුණ නිසි අයුරින් උපයෝගී කරගෙන, ඔවුන්ගේ අවධානයන්, තරඟ, විනෝදාංශ වැනි කාර්යයන් කෙරෙහි යොමුකර, එමගින් ඔවුන් තුල සමාජ සේවය හා යහපත් පුරවැසි භාවයේ ගුණාංග වැඩි දියුණු කරගැනීමට ඉවහල් වන මෙම තරුණ ගොවි සමාජ ව්‍යාපාරය කෙරෙහි දෙමව්පියන්, වැඩිහිටියන්, හා ගුරුවරුන් වඩාත් උනන්දුවීමෙන් ශ්‍රී ලංකාව තුල සිටින හැත්තෑලක්ෂයකට අධික තරුණ තරුණියන්ට, තරුණ ගොවි සමාජ තුලින් දීප්තිමත් අනාගතයක් සංවර්ධනය කර ගැනීමට ඉඩ ලැබේවායි පතමි.